www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සමග එක්වන්න

## Join the International Students for Social Equality!

**සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (එක්සත් ජනපද) ව්‍යාපාරයේ ප්‍රකාශය**
**2008 සැප්තැම්බර් 11**

යුද්ධයට සහ අසමානතාවට එරෙහි අරගලය සියතට ගන්නා ලෙසත් සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සමග එක්වන ලෙසත් කම්කරුවන්ගේ හා ශිෂ්‍ය තරුනයන්ගේ ජාත්‍යාන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනගන ලෙසත් සසජාශි ලොව පුරා සිටින ශිෂ්‍යයන්ට කැඳවුම් කර සිටී.

ගෝලීය අවපාතය සහ වසර 70 කට පසුව දිගහැරෙන ගැඹුරුතම ආර්ථික අර්බුදය මධ්‍යයේ ලෝකයේ ජාතීන් යුද්ධය කරා ලුහුටා යද්දී ශිෂ්‍යයෝ මේ මාසයේ යලි පාඨශාලා කරා පැමිනෙති.

ඇමරිකානු මැතිවරනයේ වර්ධනය පැහැදිලි කර ඇත්තේ එක්සත් ජනපද වැසියන්ට හෝ එම මැතිවරනය දෙස මහත් උනන්දුවෙන් බලා සිටින ලෝක වාසීන්ට ප්‍රධාන පක්ෂ දෙකම කිසිදු ඉදිරි මාවතක් ඉදිරිපත් නොකරන බවයි.

ඇමරිකානු ජනතාවට බුෂ් පරිපාලනය කෙරෙහි පවත්නා විශ්වීය වෛරයට වෙනසක් පිලිබඳ හිස් පොරොන්දු සමගින් ආමන්ත්‍රනය කිරීමට යත්න දැරූ ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂක බරක් ඔබාමා, ප්‍රාථමික වටය අවසන් වූ තැන් පටන් තම සැබෑ දේශපාලන චරිතය පෙන්වා ඇත. ආන්ඩුවේ ඔත්තු බැලීමේ හැකියාවන් ඉහල දැමීමට ඡන්දය දී ඇති ඔහු බුෂ් පරිපාලනය ධනවතුන්ට ලබා දෙන බදු සහන කපා හරින බවට කලින් දුන් පොරොන්දුවෙන් පසුබා ගොස් ඇත්තේ එක්සත් ජනපද යුද අර්බුදය පාවිච්චි කොට ඇත්තේ පසු ගිය වසරේ පමනක් 3% ට වැඩි ප්‍රමානයකින් වැටුප් මට්ටම් පහත හෙලමින් කම්කරුවන්ට එරෙහිව නිර්දය ප්‍රහාරයක් එල්ල කිරීමටයි.

ඇරිස්ටෝටල් "පොලිටික්ස්" (දේශපාලනය) ලියූ තැන් පටන් ප්‍රකට කාරනය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ අසමානතාව අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර්ය බවයි. හරියට ම එයට ගැලපෙන පරිදි සමාජ අසමානතාව වර්ධනය වන තතු තුල එක්සත් ජනපද ආන්ඩුව මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කප්පාදු කොට ඇත. ත්‍රස්තවාදීන් යැයි චෝදනා කොට නඩු පැවරීම සඳහා විරෝධතාවල යෙදුනු අය අත්අඩංගුවට ගනු ලැබූ ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් ජාතික සම්මේලනවල දී ව්‍යවස්ථාමය රැකවරනයන්ගේ බාදනය වීම සම්පූර්නයෙන් ප්‍රදර්ශනය විය. එහෙත් එය වනාහි ඉදිරියේ සිදුවීමට නියමිත දෙයෙහි සුලුපහේ අත්දැකීමක් පමනි.

යුද්ධය පුපුරා යාම සහ ලෝක අවපාතය වනාහි ධනේශ්වර පද්ධතියේ පුලුල් ගෝලීය පරිමාන අර්බුදයේ රෝග ලක්ෂනයෝ ය. මෙම මාවත ඔස්සේ තව දුරටත් ඉදිරියට යාමට නොහැක. එහෙත් මනුෂ්‍ය වර්ගයා ඉදිරියට ගමන් කල යුතු අතර ඔවුන්ට ඉදිරියට ගමන් කල හැකි ය. ඒ සඳහා අවශ්‍ය වන්නේ නවීන තාක්ෂනය විසින් නිපදවනු ලැබ ඇති සම්පත් සහ ගෝලීය ආර්ථිකය පුද්ගලික ලාභය උදෙසා නොව සමාජ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා මුලුමනින් භාවිතයට ගන්නා පරිදි ආර්ථික ජීවිතය සැලසුම් සහගත ලෙස හා ප්‍රජාතාන්ත්‍රික පාලනය යටතේ ප්‍රතිසංවිධානය කිරීම හෙවත් සමාජවාදය යි. එහෙත් සමාජවාදය ලඟා කරගත හැකි එකම මාවත වන්නේ සමාජවාදී න්‍යාය සවිඥ්ඥානිකව අවබෝධ කරගනිමින් කම්කරු පන්තියේ දේශපාලන පක්ෂයක් නිර්මානය කිරීමේ මහජන අරගලය හරහායි. සසජාශි සටන් වදින්නේ ඒ සඳහා ය.

සමාජ සමානතාව සඳහා ජාත්‍යාන්තර ශිෂ්‍යයෝ යනු සමාජවාදී සමානතා පක්ෂයේ ශිෂ්‍ය සංවිධානයයි. එක්සත් ජනපදයේත් ලෝකය පුරාත් ශිෂ්‍යයන්ට මෙම අරගලය සමග එක්වන ලෙස අපි ආයාචනා කොට සිටිමු. සසජාශි වෙත බැඳී ඔබගේ පාසලේ හෝ උසස් පාඨශාලාවේ එහි ශාඛා ගොඩනගන්න.

සසජාශි සමග එක්වන්න. එලඹෙන මාසවල දී සසජාශි එක්සත් ජනපදය පුරා රැස්වීම් මාලාවක් පවත්වනු ඇත. වැඩි විස්තර සඳහා සසජාශි විමසන්න.

සසජාශි සම්පූර්න ප්‍රකාශය කියවන්න.



© www.wsws.org